**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - 2017**

**--------------------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ දේපළ, පිරියත හා උපකරණ, ප්‍රත්‍යාගණන සිදු කළ අවස්ථාවේදී වටිනාකම රු.2,491,050 ක් වූ දේපළ, ප්‍රත්‍යාගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර එම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ගොඩනැගිලි අත්පත් කරගැනීම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.23,652,348 ක් ලෙස සඳහන් කර තිබුණද ගොඩනැගිලි ගිණුම අනුව ප්‍රවර්තන වර්ෂයේ අත්පත් කරගැනීම් රු.23,405,904 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අත්පත් කරගැනීම් රු.246,444 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව අර්ධ ස්ථාවර දේශන ශාලා (Semi-Permanent Lecture Hall) සඳහා වර්ෂයට සියයට 20 ක් බැගින් ක්ෂය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ සියයට 5 ක් බැගින් ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.681,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ අත්පත් කරගත් ගොඩනැගිලි සඳහා ක්ෂය වෙන්කිරීම් රු.52,033 ක් විය යුතු වුවද රු.6,490 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.45,543 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) "භාවිතයෙන් ඉවත් කරන ලද පුස්තකාල ග්‍රන්ථ විධිමත් ලෙස එකතුවෙන් ඉවත්කිරීම" මැයෙන් වූ 2017 සැප්තැම්බර් 08 දිනැති අංක 426/4051 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව පුස්තකාල ග්‍රන්ථ ඉවත් කිරීම, නොමිලේ බෙදා හැරීම, අලෙවි කිරීම හා අනෙකුත් දෙපාර්තමේන්තු පුස්තකාල සඳහා නිකුත් කරන ලද ආදී ග්‍රන්ථ 690 ක පිරිවැය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පොත් අත්තිකාරම් ශේෂය රු.3,840,830 ක් වුවද අත්තිකාරම් ලේඛනය අනුව එම ශේෂය රු.4,026,081 ක් වූයෙන් රු.185,251 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට වත්කම් සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය, බඩු වට්ටෝරු පොත අනුව ශේෂය සමග සැසඳීමේදී වටිනාකම රු.229,750 ක් වූ වත්කම් ඒකක 30 ක් බඩු වට්ටෝරු පොතෙහි ලේඛනගත කර නොතිබූ බව හා රු.502,350 ක් වටිනා වත්කම් ඒකක 63 ක ඌණතාවයක් පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දින විදේශීය ප්‍රකාශන ආයතනයක් වෙත රු.1,618,141 ක අත්තිකාරම් ලබා දී තිබූ අතර අත්තිකාරම් පියවීමේදී අවස්ථා 3 කදී එකතුව රු.1,803,092 ක් පියවීමට අවශ්‍ය පොත් ලබා දී තිබුණි. අත්තිකාරම් ලේඛනය නිවැරදිව පවත්වාගෙන නොයාම නිසා වැඩියෙන් පියවන ලද රු.184,951 කට අදාළව දෙන ලද අත්තිකාරම් මුදල පිළිබඳව අත්තිකාරම් ලේඛනයේ සඳහන් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය අනුග්‍රහය මත පශ්චාත් උපාධි පුහුණුවක් සඳහා විදේශගත වූ කථිකාචාර්යවරයෙකුගේ ගුවන් ප්‍රවේශපත් ගාස්තු ලෙස 2012 වර්ෂයේ දී ආයතනයෙන් ගෙවන ලද රු.79,000 ක් 2017 වර්ෂය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) පොත් මිලදී ගැනීම සඳහා පොත් ප්‍රකාශකයින් වෙත ලබා දී තිබූ රු.3,840,830 ක් වූ අත්තිකාරම් ශේෂය තුළ වර්ෂ 1 සිට වර්ෂ 4 දක්වා පැරණි රු.1,412,012 ක් වූ ණය ශේෂයක් ඇතුළත්ව තිබුණි.

## 2.4 නීතී රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වු නීති රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් වශයෙන් ලබාගත් මුදල් අදාළ කාර්යය අවසාන වූ වහාම පියවිය යුතු වුවත් පියවීම සඳහා මාස 2 සිට මාස 11 දක්වා ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය විය. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 හා 4.2.6 වගන්ති | යුනානි, ආයුර්වේද හා පශ්චාත් උපාධි අංශවල ආංශික කාර්යසාධනය, කළමණාකරණ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කර තිබුණද කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.23,668,975 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.31,183,577 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,514,602 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.40,681,000 කින් වැඩි වීම හා විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.10,535,465 කින් අඩු වීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේ මූල්‍ය අතිරික්තයක් හා 2013, 2015, 2016 හා 2017 වර්ෂවලදී ඌනතාවයක් ඇතිවී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2013 වර්ෂයේ රු.174,701,679 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.290,422,423 තෙක් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීමේදී සමස්ත පිරිවැය ඒ ඒ කාර්යයන් සඳහා බෙදා වෙන්වෙන ආකාරය (Cost Allocation) නිරූපනය කර නොතිබීම හා ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ආයතනයේ ඉලක්ක හා අරමුණු ළඟාවීම් මැන බැලීමට නොහැකි විය.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) ජේදය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද, ආයතනය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මෙහි ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාල වකවානු දක්වා තිබුණද ආයතනය තුළ සිදු කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී සැලසුම් කරන ලද කාල වකවානු අනුව සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) පසුගිය වර්ෂයට අදාළව ඉටු නොවී පවතින ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන සැලැස්ම තුළ අවිච්ඡින්න වැඩ ලෙස දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රසම්පාදනය තුළින් අපේක්ෂිත ඉලක්ක හා අවිච්ඡින්න තත්ත්වය වෙන වෙනම හඳුනාගත නොහැකි විය.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වසර 6 තුළදී ආයතනයේ සිසුන් බඳවාගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමේදී විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් අනුව බඳවා ගැනීමට පහසුකම් තිබුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව සිසුන් 1340 ක් වූ නමුත් එම කාල පරිච්ඡේදයට අදාළව බඳවාගෙන තිබෙනුයේ සිසුන් 1185 දෙනෙකු පමණි.

(ආ) අධ්‍යයන වර්ෂ 5 කට අදාළ විභාග ප්‍රතිඵල පරීක්ෂා කිරීමේදී විභාග සඳහා පෙනී සිටි සිසුන්ගෙන් විභාග අසමත් වීමේ ප්‍රතිශතය, සිසුන්ගේ ජ්‍යෝෂ්ඨතාවය සමග වර්ධනය වී තිබුණු අතර විස්තර පහත දැක්වේ.

(i) 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂය දක්වා ආයුර්වේද සහ යුනානි වෛද්‍ය උපාධි සඳහා 2017 වර්ෂය තුළදී නියමිත විභාග වාර 18 ක් සඳහා විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අසමත් වීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 39 ක් සහ සියයට 25 ක් විය.

(ii) ආයුර්වේද සහ යුනානි වෛද්‍ය උපාධි පාඨමාලාවන් සඳහා 2010 වර්ෂයේදී නව විෂය නිර්දේශය හඳුන්වා දී තිබූ අතර පැරණි හා නව විෂය නිර්දේශය යටතේ එක් එක් විභාගයන් අසමත් සිසුන් සඳහා 2017 වර්ෂය තුළදී අතිරේක විභාග 11 ක් පවත්වා තිබුණි. නමුත් එම විභාගවලට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අසමත් වීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 56 ක් සහ සියයට 71 ක් විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් 99 අවුරුදු බදු පදනමට ලබාගන්නා ලද ගොඩනැගිල්ලක දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය සහ පිරිමි සිසුන් සඳහා නේවාසිකාගාරයක් පවත්වාගෙන යනු ලබයි. නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගැනීමට රජයේ ප්‍රදාන වශයෙන් ලබා දී තිබූ රු.101,000,000 ක් එම කාර්ය ඉටු නොකිරීම මත 2017 මාර්තු 10 වන දින නැවත භාණ්ඩාගාරය වෙත යවා තිබුණි.

### 4.3 ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය

---

ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව වාර්ෂිකව ප්‍රසම්පාදනයන් සිදු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ 2017 ජනවාරි 01 දිනට රු.115,991,414 ක ශේෂයක් තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු.43,600,000 ක් ලැබී තිබුණු අතර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වර්ෂය තුළදී රු.45,792,461 ක් වැයකර තිබුණි. එසේම, ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදි කිරීම සඳහා ඉඩම මිලදී නොගැනීම මත ආපසු මහා භාණ්ඩාගාරය වෙත යැවූ රු.101,000,000 ක් ද ඇතුළත්ව 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය රු.113,798,953 ක් විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා රු.1,800,000 ක් වෙන්කර තිබුණු කාර්යයන් 3 කට අදාළ කටයුතු ඉටුකර නොතිබුණු අතර 2015 සහ 2016 වර්ෂවලට අදාළ වැඩ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.13,562,425 ක් වැය කර තිබුණි. එයින් රු.2,380,929 කට අදාල කාර්යයන් 2017 දෙසැම්බර් 31 දින වන විට ද නිමකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රසායනාගාර උපකරණ මිලදී ගැනීම, වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සහ පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 1 බැගින් රු.මිලියන 3 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් අදාළ මිළදී ගැනීම් කිසිවක් සිදුකර නොතිබුණි.

(ඇ) ධාරිතා වර්ධන පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සැළසුම් කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.1,700,000 ක් වූ ක්‍රියාකාරකම් 04 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරිය වෙත යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) විදේශීය වාර සඟරා අත්තිකාරම් ලේඛනය | | විදේශීය වාර සඟරා සඳහා අත්තිකාරම් ලබාදීම් සම්බන්ධයෙන් විස්තර ඇතුළත් කර පවත්වාගෙන යනු ලබන අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොගැනීම. |
| (ආ) වත්කම් පාලනය | (i) | සමාලෝචිත වර්ෂය තුළ අත්පත්කර ගන්නා ලද වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයෙහි සටහන් කිරීමේදී අංකනය නොකිරීම. |
| | (ii) | වත්කම් සමීක්ෂණ වාර්තා හා භාණ්ඩ වට්ටෝරු පොත් අතර විචලතා පැවතීම. |
| (ඇ) ගිණුම්කරණය | (i) | භාවිතයෙන් ඉවත් කරන ලද පුස්තකාල ග්‍රන්ථ පරිග්‍රහන ලේඛනයෙන් ඉවත්කර තිබුණද එම ග්‍රන්ථවල පිරිවැය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් නොකිරීම. |
| | (ii) | මූල්‍ය ප්‍රකාශන අත්තිකාරම් ලේඛන සමග නොසැසඳීම. |
| (ඈ) සැලසුම් කිරීම | | ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දුර්වලතා පැවතීම. |
| (ඉ) ප්‍රසම්පාදනය | (i) | වර්ෂය සඳහා සැලසුම් කරන ලද ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී නිම නොකිරීම නිසා ඒ හේතුවෙන් රාජ්‍ය ප්‍රදාන ආපසු යැවීම. |
| | (ii) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන අත්පොත සහ ප්‍රසම්පාදන සැලැසුම් අනුව කටයුතු නොකිරීම. |